human services

Sinhalese: The Role of Carers

# සිංහල: රැකබලා ගන්නන්ගේ කාර්ය භාරය

සරණාගත බාල වයස්කරුවන් පිළිබඳ වැඩසටහනේ (Refugee Minor Program, (RMP)) සෑම සේවා දායකයෙක්ම දෙමව්පියන් සමඟ වාසය නොකරන බැවින්,අප සේවා දායක කණ්ඩායමෙහි සෞඛ්‍යය හා යහපැවැත්ම සහතික කර ගැනීම සඳහා රැකබලා ගන්නාගේ කාර්ය භාරය ඉතාමත් තීරණාත්මකය.

රැකබලාගන්නන්ට ඇතුලත්වන්නේ:

- ලේ නෑයන්ගේ එකමුතුවක්, පවුල් පෙළපතෙහි අය ඇතුළුව, අදාළ සංස්කෘතික ප්‍රජාවේ සාමාජිකයන්, මිතුරන්, ළමයා/තරුණ පුද්ගලයා හඳුනන අනෙක් අය.
- විකල්ප රැකබලාගන්නන්, කැපකරු රැකබලාගන්නන් ඇතුළුව

Non-ward සේවා දායකයන් වෙනුවෙන් RMP සහභාගීත්වය ඇරඹෙන්නේ කිනම් සංස්කෘතියක වුවද ඉතාම හොඳින් ළමුන්ව රැක බලා ගනු ලබන්නේ දෙමව්පියන් විසින්ය යන මූලික සංකල්පය මත වන අතර, මෙය කළ නොහැකි විට ඔවුන්ව හොඳින්ම රැක බලාගනු ලබන්නේ එම සංස්කෘතියේම ළඟ නෑයන් විසිනි. එම නිසා non-ward සම්බන්ධයෙන් RMP කටයුතු කරන්නේ හැකි සෑම තැනකදීම ළමයා/තරුණ පුද්ගලයා නෑයන්ගේ රැකවරණය යටතට පත්කිරීම හා එම රැකවරණය ඉදිරියට පවත්වා ගැනීමේ පරමාර්ථයෙනි. සාමාන්‍යයෙන්, නෑයා තම සංස්කෘතියට අයත්, තම භාෂාව කථාකරන, ළමයා/තරුණ පුද්ගලයාගේ පවුල් ඉතිහාසය තේරුම්ගත්, සහ  බොහෝ විට , ළමයා/තරුණ පුද්ගලයාට සමාන සරණාගත අත්දැකීම් ඇති අයෙක් වෙයි.



State Government Victoria